جمعية خدمة المحتوى
الإسلامي باللغات

ضيوف الرحمن
hajjumrh.com



# මහඟු ප්‍රාර්ථනා

සිංහල

سنهالي

ضيوف الرحمن
hajjumrh.com

شركاء التنفيذ :

دار الإسلام | بيان الإسلام | رواد التراجم | المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع
الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص

Tel : +966 50 244 7000
info@islamiccontent.org
Riyadh 13245-2836
www.islamiccontent.org

# මහඟු ප්‍රාර්ථනා
## පළමුව අල් කුර්ආනයේ සඳහන් ප්‍රාර්ථනා:

1. "රබ්බනා තකබ්බල් මින්නා ඉන්නක අන්තස් සමීඋල් අලීම්"*
(අප ගේ පරමාධිපතියාණනි! (අප කළ ක්‍රියාවන්) අපගෙන් පිළි ගනු මැනව! නියත වශයෙන් ම සර්ව ශ්‍රාවක සර්ව ඥානී වන්නේ ඔබම ය.)
"වතුබ් අලයිනා ඉන්නක අන්තත්-තව්වාබුර් රහීම්"
(තව ද අප වෙත පාප ක්ෂමා ව පිරි නමනු මැනව! සැබැවින් ම අති ක්ෂමාශීලී අසමසම කරුණාන්විත වන්නේ ඔබම ය.)

2. "රබ්බනා ආතිනා ෆිද්-දුන්යා හසනතන් වෆිල් ආකිඃරති හසනතන් වකිනා අදාබන්නාර්" (අපගේ පරමාධිපතියාණනි, මෙලොවෙහි යහපතද පරලොවෙහි යහපතද අපට පිරිනමනු මැනව. තවද නිරයේ වේදනාවෙන් අප ආරක්ෂා කරනු මැනව!)



3 "රබ්බනා ලා තුආකිඃද්නා ඉන් නසීනා අව් අක්ඃතඅනා"
(අප (යමක්) අමතක කළේ නම් හෝ අප වරදක් කළේ නම් හෝ අපව දඬුවමට ග්‍රහණය නොකරනු මැනව!)

4 "රබ්බනා වලා තහ්මිල් අලයිනා ඉස්රන් කමා හමල්තහූ අලල්ලදීන මින් කබ්ලිනා"
(තවද අපට පෙර සිටියවුන් මත කවර දෙයක් ඔබ උසුලන්නට සැලැස්වූයේ ද එවැනි බරක් අපට උසුලන්නට නොසලස්වනු මැනව!)



5 "රබ්බනා වලා තුහම්මිල්නා මා ලා තාකත ලනා බිහි වඃෆු අන්නා වග්ෆිර්ලනා වර්හම්නා අන්ත මව්ලානා ෆන්සුර්නා අලල් කව්මිල් කාෆිරීන්"
(කවර දෙයක් අපට සිදු කිරීමට ශක්තිය නොමැත්තේ ද එවැන්නක් අප මත නොපටවනු මැනව! (අප කළ වැරදි) අපගෙන් නොසලකා හරිනු මැනව! තවද අපට සමාව දෙනු මැනව! තවද අපට කරුණා කරනු මැනව! ඔබ අපගේ භාරකරුය. එබැවින් දේව ප්‍රතික්ෂේපිත පිරිසට එරෙහි ව අපට උදව් කරනු මැනව!)

6 "රබ්බනා ලා තුසිඃ කුලූබනා බඃද ඉද් හදයිතනා වහබ්ලනා මිල්ලදුන්ක රහ්මතන් ඉන්නක අන්තල් වහ්හාබ්"
(අපගේ පරමාධිපතියාණනි, ඔබ අප ව යහමග යොමු කළ පසු ව අපගේ හදවත් විකෘතිභාවයට පත් නොකරනු මැනව! තවද අපට ඔබ වෙතින් වූ දයාව පිරිනමනු මැනව! සැබැවින් ම ඔබ ම ය මහා ත්‍යාගශීලී.)

7 "රබ්බනා ඉන්නනා ආමන්නා ෆග්ෆිර්ලනා දුනූබනා වකිනා අදාබන් නාර්"
(අපගේ පරමාධිපතියාණනි! සැබැවින්ම අපි විශ්වාස කළෙමු. එබැවින් අපගේ පාපයන්ට අපට සමාව දෙනු මැනව. අපා ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව!)

8 "රබ්බි හබ් ලී මිල්-ලදුන්ක දුර්රියයතන් තය්යිබතන් ඉන්නක සමීඋද් දුආඃ"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ වෙතින් මට දැහැමි පරපුරක් පිරිනමනු මැනව! සැබැවින් ම ඔබ ප්රාර්ථනාවට සවන් දෙන්නා ය.)

9 "රබ්බනා ආමන්නා බිමා අන්දලත් වත්තබඃනර් රසූල ෆක්තුබ්නා මඅෂ් ෂාහිදීන්"
(අපගේ පරමාධිපතියාණනි! ඔබ පහළ කළ දෑ අපි විශ්වාස කළෙමු. රසූල්වරයා ව ද අපි අනුගමනය කළෙමු. එබැවින් ඔබ අප ව සාක්ෂිකරුවන් සමඟ සටහන් කර ගනු මැනව!)

10 "රබ්බනග්ෆිර් ලනා දුනූබනා ව ඉස්රාෆනා ෆී අම්රිනා වසබ්බිත් අක්දාමනා වන්සුර්නා අලල් කව්මිල් කාෆිරීන්"
(අපගේ පරමාධිපතියාණනි! අපගේ පාපයන්ටත් අප විෂයෙහි සිදු වන සීමාව ඉක්මවීම් වලටත් අපට සමාව දෙනු මැනව! තවද අපගේ පාද ස්ථාවර කරනු මැනව! ප්රතික්ෂේප කළ ජනයාට එරෙහි ව ද අපට උදව් කරනු මැනව!)

11 "රබ්බනා මා කලක්ත හාදා බාතිලන් සුබ්හානක ෆකිනා අදාබන් නාර්"
(අපගේ පරමාධිපතියාණනි! ඔබ මෙය නිකරුණේ නොමැව්වෙහිය. ශබ සුපිවිතුරු ය. එබැවින් අපව (නිරා) ගින්නේ දඬුවමින් ආරක්ෂා කරනු මැනව!)

12 "රබ්බනා ඉන්නක මන් තුද්හිඃලින්-නාර ෆකද් අහඃදෙයිතහූ වමා ලිල්ළාලිමීන මින් අන්සාර්"
(අපගේ පරමාධිපතියාණනි! නියත වශයෙන් ම ඔබ කවරෙකු ව (නිරා) ගින්නට ඇතුළත් කරන්නෙහි ද එවිට සැබැවින් ම ඔබ ඔහු ව අවමානයට පත් කරන්නෙහිය. තවද අපරාධ කරුවන්ට උදව් කරුවන් කිසිවෙකු නොමැත.)

13 "රබ්බනා ඉන්නක මන් තුද්හිලින්-නාර ෆකද් අහ්ෂෙයිතහූ වමා ලිල්ළාලිමීන මින් අන්සාර්"

(අපගේ පරමාධිපතියාණනි! නියත වශයෙන් ම ඔබ කවරෙකු ව (නිරා) ගින්නට ඇතුළත් කරන්නෙහි ද එවිට සැබැවින් ම ඔබ ඔහු ව අවමානයට පත් කරන්නෙහිය. තවද අපරාධ කරුවන්ට උදව් කරුවන් කිසිවෙකු නොමැත.)

14 "රබ්බනා ඉන්නනා සමිඃනා මුනාදියන් යුනාදී ලිල් ඊමානි අන් ආමිනූ බි රබ්බිකුම් ෆආමන්නා ෆග්ෆිර් ලනා දුනූබනා වකෆ්ෆිර් අන්නා සය්යිආතිනා වතවෆ්ෆනා මඅල් අබ්රාර්"

(අපගේ පරමාධිපතියාණනි! නුඹලාගේ පරමාධිපති ව නුඹලා විශ්වාස කරනු යැයි, දේව විශ්වාසය වෙත කැඳවන කැඳවුම් කරුට සැබැවින් ම අපි සවන් දුනිමු. එවිට අපි විශ්වාස කළෙමු. එබැවින් අපගේ පාපයන් සමා කරනු මැනව! අපගේ නපුරුකම් අපගෙන් පහ කරනු මැනව! තවද අප ව දැහැමියන් සමග මරණයට පත් කරනු මැනව!)

15 "රබ්බනා වආතිනා මා වඅද්තනා අලා රුසුලික වලා තුඛ්සින් යව්මල් කියාමති ඉන්නක ලා තුක්ලිෆුල් මීආද්"

(අපගේ පරමාධිපතියාණනි! තවද නුඹගේ ධර්ම දූතයින් තුළින් අපට ප් රතිඥා දුන් දෑ අපට පිරිනමනු මැනව! මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අප ව දුකට පත් නොකරනු මැනව! සැබැවින් ම ඔබ ප් රතිඥා කඩ නොකරන්නෙහිය.)

16 "රබ්බනා ළලම්නා අන්ෆුසනා වඉල් ලම් තග්ෆිර්ලනා වතර්හම්නා ලනකූනන්න මිනල් කාසිරීන්"

(අපගේ පරමාධිපතියාණනි! අපි අපටම අපරාධ කර ගත්තෙමු. තවද ඔබ අපට සමාව නොදුන්නේ නම්, එමෙන්ම ඔබ අපට කරුණා නොකළේ නම් සැබැවින්ම අපි අලාභවන්තයින් අතරින් වන්නෙමු.)



17 "රබ්බනා ලා තජ්අල්නා මඅල් කව්මිල් ළාලිමීන්"
(අපරාධකාරී ජනයා සමඟ අප පත් නො කරනු මැනව!)

18

**"හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුව අලෙයිහි තවක්කල්තු වහු ව රබ්බුල් අර්ෂිල් අළීම්."**
**(අල්ලාහ්ම මට ප්‍රමාණවත්ය. නමැදුමට සුදුස්සා ඔහු හැර වෙනත් කිසිවෙක් නැත. (මගේ සියලුම කාර්යයන්) මම ඔහුටම භාර කර, විශ්වාසය තබමි. ඔහු මහා අර්ෂ්හි පරමාධිපතිය.)**

19

"රබ්බනා ලා තජ්අල්නා ෆිත්නතල් ලිල්කව්මිල් ළාලිමීන් වනජ්ජිනා බිරහ්මතික මිනල් කව්මිල් කාෆිරීන්"
( "අපගේ පරමාධිපතියාණනි! අපරාධකාරී ජනයාට අර්බුධයක් ලෙස අප පත් නොකරනු මැනව! තවද ඔබේ දයාවෙන් දේවත්වය ප්‍රතික්ෂේප කරන ජනයාගෙන් අප මුදවා ගනු මැනව!)"

20

"රබ්බිජ්අල් හාදල් බලද ආමිනා, වජ්නබ්නී වබනිය්ය අන් නඃබුදල් අස්නාම්" (මාගේ පරමාධිපතියාණනි! මෙම නගරය අභයදායී ලෙස පත් කරනු මැනව! තවද මා හා මාගේ පුතණුවන් වන අප, පිළිම වලට නැමදීමෙන් දුරස් කරනු මැනව!)

21 "රබ්බිජ් අල්නී මුකීමස් සලාති වමින් දුර්රිය්යතී රබ්බනා වතකබ්බල් දුආඉ"
(මාගේ පරමාධිපතියාණනි! මා සලාතය විධිමත් ව ඉටු කරන්නෙකු බවට පත් කරනු මැනව! තවද මාගේ පරපුරින් ද පත් කරනු මැනව! අපගේ පරමාධිපතියාණනි! තවද මාගේ අයැදුම පිළිගනු මැනව!)

22 "රබ්බනග්ෆිර් ලී වලිවාලිදය්ය වලිල් මුඃමිනීන යව්ම යකූමුල් හිසාබ්"
(අපගේ පරමාධිපතියාණනි! විනිශ්චය දිනයේ මට ද මාගේ දෙමාපියන්ට ද දේවත්වය විශ්වාස කරන්නන්ට ද සමාව දෙනු මැනව!)

23 "රබ්බනා ආතිනා මිල්ලදුන්ක රහ්මතන් වහය්යිඃ ලනා මින් අම්රිනා රෂදා"
(අපගේ පරමාධිපතියාණනි! නුඹ වෙතින් වූ කරුණාව අපට පිරිනමනු මැනව! අපගේ කටයුතු සෘජු ලෙස අපට සකස් කර දෙනු මැනව.!)

24 "රබ්බෂ්-රහ්ලී සද්රී, වයස්සිර්ලී අම්රී"
(මාගේ පරමාධිපතියාණනි! මාගේ හදවත මා වෙත විවෘත කර දෙනු මැනව! තවද මාගේ කටයුතු මා හට පහසු කර දෙනු මැනව!)

25 (රබ්බී සිද්නී ඉල්මා)
(මාගේ පරමාධිපතියාණනි! දැනුම මට වර්ධනය කර දෙනු මැනව!)

26 "ලා ඉලාහ ඉල්ලා අන්ත සුබ්හානක ඉන්නී කුන්තු මිනල් ළාලිමීන්"
(නැමදුමට සුදුස්සා ඔබ හැර අන් කිසිවෙකු නොමැත. ඔබ සුවිශුද්ධය. නියත වශයෙන්ම මම අපරාධකරුවන් අතුරින් කෙනෙකු වූයෙමි.)





27 "රබ්බි ලා තදර්නී ෆර්දන් වඅන්ත ඛයිරුල් වාරිසීන්"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ මා තනි ව අතහැර නො දමනු. තවද ඔබ උරුමක්කරුවන්ගෙන් ශ්‍රේෂ්ඨයාය.)

28 "රබ්බි අඌදු බික මින් හමදාතිෂ්-ෂෙයාතීනි වඅඌදු බික රබ්බි අය් යහ්ළරූන්"
(තවද මාගේ පරමාධිපතියාණනි! ෂෙයිතානුන්ගේ පෙළඹවීම් වලින් මම ඔබෙන් ආරක්ෂාව පතමි. තවද මාගේ පරමාධිපතියාණනි! ඔවුන් මා වෙත සම්මුඛ වීමෙන් මම ඔබෙන් ආරක්ෂාව පතමි.)

29 "රබ්බනා ආමන්නා ෆග්ෆිර්ලනා වර්හම්නා වඅන්ත ඛයිරුර් රාහිමීන්"
(අපගේ පරමාධිපතියාණනි! අපි විශ්වාස කළෙමු. එහෙයින් අපට සමාව දෙනු මැනව! තවද අපට කරුණා කරනු මැනව! තවද ඔබ කරුණාවන්තයින්ගෙන් ශ්‍රේෂ්ඨතමයා ය.)

30 "රබ්බිග්ෆිර් වර්හම් වඅන්ත කයිරුර් රාහිමීන්"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ සමාව දෙනු මැනව! තවද කරුණා කරනු මැනව! තවද ඔබ කරුණාවන්තයින්ගෙන් අති ශ්‍රේෂ්ඨය.)

31 "රබ්බනස්රිෆ්නා අන්නා අදාබ ජහන්නම ඉන්න අදාබහා කාන ගරාමා, ඉන්නහා සාඅත් මුස්තකර්රන් වමුකාමා"
(අපගේ පරමාධිපතියාණනි! නිරයේ දඬුවම අපගෙන් ඉවත් කරනු මැනව! නියත වශයෙන්ම එහි දඬුවම පීඩාවකි. නියත වශයෙන්ම එය වාසස්ථානයෙන් හා නවාතැනින් ද නපුරු විය.)



32 "රබ්බනා හබ් ලනා මින් අස්වාජිනා වදුර්රියියාතිනා කුර්රත අඃයුනින් වජ්අල්නා ලිල්මුත්තකීන ඉමාමා"
(අපගේ පරමාධිපතියාණනි! අපගේ බිරියන්ගෙන් ද අපගේ දරු පරපුරෙන් ද නෙත් පිනවන සිසිල අපට ඇති කරනු මැනව! තවද බිය බැතිමතුන් මෙහෙයවන්නන් බවට අප පත් කරනු මැනව!)

33 "රබ්බි අව්සිඃනී අන් අෂ්කුර නිඃමතකල්ලතී අන්අම්ත අලය්ය වඅලා වාලිදය්ය වඅන් අඃමල සාලිහන් තර්ළාහා වඅද්හිල්නී බිරහ්මතික ෆී ඉබාදිකස්-සාලිහීන්"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ මා හා මාගේ දෙමාපියන් වෙත දායාද කළ ආශිර්වාදයන් සඳහා මා කෘතවේදී වීමටත් ඔබ පිළිගන්නා අයුරින් දැහැමි දෑ මා සිදු කිරීමටත් මට ඔබ දායාද කරනු මැනව! තවද ඔබේ කරුණාව තුළින් ඔබේ දැහැමි ගැත්තන් අතරට මා ඇතුළත් කරනු මැනව!)

34 "රබ්බි ඉන්නී ළලම්තු නෆ්සී ෆග්ෆිර් ලී"
(මාගේ පරමාධිපතියාණනි! නියත වශයෙන්ම මම මටම අපරාධ කර ගත්තෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව!)

35 "රබ්බි නජ්ජිනී මිනල් කව්මිල් ළාලිමීන්"
(මාගේ පරමාධිපතියාණනි! අපරාධකාරී ජනයාගෙන් මා මුදවා ගනු මැනව!)

36 **"අසා රබ්බී අය්-යහ්දීනී සවාඅස් සබීල්"**
**(මාගේ පරමාධිපති මට නිවැරදි මග පෙන්වන්නට හැකිය.)**

37 "රබ්බි ඉන්නී ලිමා අන්සල්ත ඉලය්ය මින් හෑයිරින් ෆකීර්"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ මා වෙත පහළ කළ යහපත කෙරෙහි සැබැවින්ම මම අවශ්‍යතා ඇත්තෙකු වෙමි)

38 "රබ්බි හබ්ලී මිනස් සාලිහීන්"
(මාගේ පරමාධිපතියාණනි! මා හට දැහැමියන් අතරින් කෙනෙකු පිරිනමනු මැනව!)

39 "රබ්බි අව්සිඃනී අන් අෂ්කුර නිඃමතකල්ලතී අන්අම්ත අලය්ය වඅලා වාලිදය්ය වඅන් අඃමල සාලිහන් තර්ළාහු වඅස්ලිහ් ලී ෆී දුර්රිය්යතී ඉන්නී තුබ්තු ඉලයික වඉන්නී මිනල් මුස්ලිමීන්"
(මාගේ පරමාධිපතියාණනි! ඔබ මා වෙත හා මාගේ දෙමව්පියන් වෙත දායාද කළ ඔබේ ආශිර්වාදය සඳහා මා කෘතවේදී වීමටත් ඔබ තෘප්තියට පත් වන අයුරින් දැහැමි දෑ සිදු කිරීමටත් මට භාග්‍යය ලබා දෙනු මැනව! තවද මාගේ පරපුර තුළ ද මාහට දැහැමි බව ඇති කරනු මැනව! නියත වශයෙන්ම මම පාප සමාව අයැද ඔබ වෙත නැඹුරු වෙමි. තවද නියත වශයෙන්ම මම මුස්ලිම්වරුන් (අල්ලාහ්ට අවනත වන්නන්) අතරින් කෙනෙකි.)

40 "රබ්බනා අලයික තවක්කල්නා වඉලයිකල් මසීර්"
(අපගේ පරමාධිපතියාණනි! ඔබ වෙත අපි (සියල්ල) භාර කළෙමු. තවද ඔබ වෙතම අපි යොමු වූයෙමු. තවද නැවත යොමු වන ස්ථානය ද ඇත්තේ ඔබ වෙතය.)

41

"රබ්බනග්ෆිර් ලනා වලිඉක්වානිනල්ලදීන සබකූනා බිල් ඊමානි, වලා තජ්අල් ෆී කුලූබිනා ගිල්ලන් ලිල්ලදීන ආමනූ රබ්බනා ඉන්නක රඌෆුර් රහීම්"
(අපගේ පරමාධිපතියාණනි! අප හා දේව විශ්වාසයෙන් අපට පෙර ඉකුත් ව ගිය අපගේ සහෝදරයින්ට සමාව දෙනු මැනව! විශ්වාස කළවුන් පිළිබඳ ව ද්වේෂයක් අපගේ සිත් තුළ ඇති නොකරනු මැනව! අපගේ පරමාධිපතියාණනි! නියත වශයෙන්ම නුඹ සෙනෙහෙවන්තය; මහා කරුණාන්විතය.)



**42**

"රබ්බනා ලා තජ්අල්නා ෆිත්නතන් ලිල්ලදීන කෆරූ වග්ෆිර් ලනා රබ්බනා ඉන්නක අන්තල් අසීසුල් හකීම්"

(අපගේ පරමාධිපතියාණනි! ප්‍රතික්ෂේප කළවුනට පරීක්ෂණයක් ලෙස අප පත් නොකරනු මැනව! තවද අපට සමාව දෙනු මැනව! අපගේ පරමාධිපතියාණනි! නියත වශයෙන්ම නුඹ සර්ව බලධාරීය; මහා ප්‍රඥාවන්තය.)

**43**

**"රබ්බනා අත්මිම් ලනා නූරනා, වග්ෆිර් ලනා ඉන්නක අලා කුල්ලි ෂෙයිඉන් කදීර්"**

**(අපගේ පරමාධිපතියාණනි! අපගේ ආලෝකය අපට පූර්ණවත් කර දෙනු මැනව! තවද අපහට සමාව දෙනු මැනව! නියත වශයෙන්ම නුඹ සියලු දෑ කෙරෙහි ශක්තිය ඇත්තාය.)**

********



# දෙවැන්න: සුන්නාවෙහි (නබි පිළිවෙතෙහි) සඳහන් ප් රාර්ථනා:

1 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ෆිත්නතින් නාරි, වඅදාබින් නාරි, වෆිත්නතිල් කබ්රි, වඅදාබිල් කබ්රි, වෂර්රි ෆිත්නතිල් ගිනා, වෂර්රි ෆිත්නතිල් ෆක්රි"

(අහෝ දෙවිඳුනි! සැබැවින්ම මම අපා ගින්නේ අර්බුදයෙන් හා අපා ගින්නේ දඬුවමින් ද මිනී වළෙහි අර්බුදයෙන් හා මිනී වළෙහි දඬුවමින් ද පොහොසත්කමේ අර්බුදයේ හානියෙන් හා දිළිඳුකමේ අර්බුදයේ හානියෙන් ද ආරක්ෂාව ඔබෙන් පතමි.)



2 **"අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ෆිත්නතිල් මසීහිද් දජ්ජාලි"**

(අහෝ දෙවිඳුනි! සැබැවින්ම මම මසීහුද් දජ්ජාල්ගේ අර්බුදෙයන් ආරක්ෂාව ඔබෙන් පතමි.)

3 "අල්ලාහුම්ම-ග්සිල් කල්බී බිමාඉස්-සල්ජි වල් බරදි, වනක්කි කල්බී මිනල් කතායා කමා නක්කයිතස් සව්බල් අබ්යළ මිනද් දනස්, වබාඉද් බය්නී වබයින හෘතායාය කමා බාඅද්ත බයිනල් මෂ්රිකි වල්-මග්රිබි"

(අහෝ දෙවිඳුනි, හිමෙන් සහ හිම කැට වතුරෙන් මගේ හදවත සෝදා හරිනු මැනව!, සුදු වස්ත්‍රය කිලිටි වලින් පිරිසිදු කරන්නාක් මෙන් මගේ හදවත ද පාපයෙන් පිරිසිදු කරනු මැනව! නැගෙනහිර සහ බටහිර අතර ඔබ විශාල දුරක් තැබූ පරිදි මා සහ මගේ පාප අතර විශාල දුරක් තබනු මැනව!)



4 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් කසලි වල් හරමි වල් මඃසමි වල් මග්රමි"

(අහෝ දෙවිඳුනි! සැබැවින්ම මම කම්මැලිකම, මහලු විය, පාපය සහ ණය බරින් ආරක්ෂාව ඔබගෙන් පතමි.)

5 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් අජ්සි වල් කසල්, වල් ජුබ්නි වල් හරමි වල් බුහ්ල්, වඅඌදු බික මින් අදාබිල් කබ්රි වමින් ෆිත්නතිල් මහ්යා වල් මමාති"

(අහෝ දෙවිඳුනි! නොහැකියාව, කම්මැලිකම, බියගුලුකම, වයෝවෘද්ධභාවය සහ මසුරුකමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි. මිනීවළේ දඬුවමෙන් සහ ජීවිතයේ සහ මරණයේ පරීක්ෂාවන්ගේ නපුරෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)

6 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ජහ්දිල් බලාඉ, වදරකිෂ්-ෂකාඉ, වසූඉල් කළාඉ, වෂමාතතිල් අඃදාඉ"

(අහෝ අල්ලාහ්! දුක්ඛිත බරින්, අභාග්‍යමත් තත්ත්වයට වැටීමෙන්, තීන්දුවේ නපුරෙන් සහ සතුරන්ගේ ප්‍රීති සෝෂාවෙන් ආරක්ෂාව මම ඔබගෙන් පතමි.)

7 "අල්ලාහුම්ම අස්ලිහ් ලී දීනියල්ලදී හුව ඉස්මතු අම්රී, වඅස්ලිහ් ලී දුන්යායල්ලතී ෆීහා මආෂී, වඅස්ලිහ් ලී ආහිඃරතියල්ලතී ඉලයිහා මආදී, වජ්අලිල් හයාත සියාදතන් ලී ෆී කුල්ලි හඃයිරින්, වජ්අලිල් මව්ත රාහතන් ලී මින් කුල්ලි ෂර්රින්."

(අහෝ දෙවිඳුනි! මාගේ කටයුත්තට ආරක්ෂාවක් වන මාගේ දහම මට විධිමත් කර දෙනු මැනව! මා ජීවත් වන මාගේ මෙලොව ද විධිමත් කර දෙනු මැනව! මම නැවත හැරී යන මාගේ මතුලොව ද මට විධිමත් කර දෙනු මැනව! සෑම යහපත් කටයුත්තකදීම වර්ධනයක් කරන්නක් බවට ජීවිතය සකසා දෙනු මැනව! සෑම නපුරකින් මට සැනසුම ලබා දෙන්නක් බවට මරණය සකසා දෙනු මැනව!)

8 **"අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් හුදා වත්-තුකා වල් අෆාෆ වල් ගිනා"**

**(අහෝ දෙවිඳුනි, සැබැවින්ම මම ඔබෙන් යහමග, බිය භක්තිය, නිර්මලකම සහ පොහොසත්කම පතමි.)**

9 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් අජ්සි වල් කසලි, වල් ජුබ්නි වල් බුහ්ලි වල් හරමි වඅදාබිල් කබ්රි"

(අහෝ අල්ලාහ්! නොහැකියාව හා මැලිකම, බිහගුලුකම හා මසුරුකම වයෝවෘද්ධභාවය හා කබ්ර්හි වේදනාව යනාදියෙන් මම ඔබෙන් ආරක්ෂාව පතමි.)

10 **"අල්ලාහුම්ම ආති නෆ්සී තක්වාහා, වසක්කිහා අන්ත කයිරු මන් සක්කාහා, අන්ත වලිය්යුහා වමව්ලාහා"**

**(අහෝ දෙවිඳුනි, මාගේ ආත්මයට එහි භක්තිය ලබා දී එය පවිත්‍ර කරනු මැනව!මක්නිසාද එය පවිත්‍ර කිරීමට හොඳම තැනැත්තා ඔබ ය. එහි ආරක්ෂකයා සහ එහි ස්වාමියා ද ඔබ ය.)**

11 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ඉල්මින් ලා යන්ෆඋ, වමින් කල්බින් ලා යක්ෂඋ, වමින් නෆ්සින් ලා තෂ්බඋ, වමින් දඃවතින් ලා යුස්තජාබු ලහා"

(අහෝ දෙවිඳුනි! කිසිදු ප්‍රයෝජනයක් නොමැති දැනුමෙන්, (ඔබට බිය නොවන) හදවතකින්, කිසිදා තෘප්තිමත් නොවන ආත්මයකින් සහ පිළිතුරු නොලැබෙන අයැදීමකින් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)



12 **"අල්ලාහුම්මහ්දිනී, වසද්දිද්නී."**
**(අහෝ දෙවිඳුනි! මට මඟ පෙන්වා ස්ථාවර කරනු මැනව!)**

13 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් සවාලි නිඃමතික, වතහව්වුලි ආෆියතික, වෆජ්අති නික්මතික, වජමීඉ සහඃතික.
(අහෝ දෙවිඳුනි! ඔබේ ආශිර්වාදයන් ඉවත්ව යාමෙන් ද, ඔබේ සුවය වෙනතකට පෙරළීමෙන් ද, ඔබේ දඬුවම අනපේක්ෂිතව පැමිණීමෙන් ද, ඔබේ සියලු කෝපයන්ගෙන් ද, ආරක්ෂාව මම ඔබෙන්ම පතමි.)

14 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ෂර්රි මා අමිල්තු වමින් ෂර්රි මා ලම් අඃමල්"
(අහෝ දෙවිඳුනි! මා කළ දේවල නපුරෙන් සහ මා නොකළ දේවල නපුරෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)

15 "ලා ඉලාහ ඉල්ලල්ලාහුල් අළීමුල් හලීම්, ලා ඉලාහ ඉල්ලල්ලාහු රබ්බුල් අර්ෂිල් අළීම්, ලා ඉලාහ ඉල්ලල්ලාහු රබ්බුස් සමාවාති වරබ්බුල් අර්ළි ව රබ්බුල් අර්ෂිල් කරීම්."
**(නැමදුමට සුදුස්සා දයාබර සර්වබලධාරී අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. නැමදුමට සුදුස්සා අති මහත් අර්ෂ්හි පරමාධිපති වූ අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. නැමදුමට සුදුස්සා අහස්හි පරමාධිපති වූ ද, මහපොළොවේ පරමාධිපති වූ ද, මහිමයෙන් යුත් අර්ෂ්හි පරමාධිපති වූ ද, අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත.)**

ضيوف الرحمن
hajjumrh.com

16 "අල්ලාහුම්ම රහ්මතක අර්ජූ ෆලා තකිල්නී ඉලා නෆ්සී තර්ෆත අයිනින්, වඅස්ලිහ් ලී ෂඃනී කුල්ලහූ ලා ඉලාහ ඉල්ලා අන්ත"
(අහෝ දෙවිඳුනි! ඔබේ ආශිර්වාදය මම පතමි. ඇහි පිය සලන සුළු මොහොතකට වුව ද මා වෙත මා භාර නොකරනු මැනව. මාගේ සියලු කාර්යයන් විධිමත් කර දෙනු මැනව. ඔබ හැර නැමදුමට සුදුසු කිසිවෙක් නැත.)

17 "අල්ලාහුම්ම ඉන්නී අබ්දුක, ඉබ්නු අබ්දික, ඉබ්නු අමතික, නාසියතී බියදික, මාලින් ෆීය්ය හුක්මුක, අද්ලුන් ෆීය්ය කළාඋක, අස්අලුක බිකුල්ලි ඉස්මින් හුව ලක සම්මයිත බිහී නෆ්සක, අව් අල්ලම්තහූ අහදන් මින් හෑල්කික, අව් අන්සල්තහූ ෆී කිතාබික අවිස්තඃසර්ත බිහී ෆී ඉල්මිල් ගයිබි ඉන්දක, අන් තජ්අලල් කුර්ආන රබීඅ කල්බී, වනූර සද්රී, වජිලාඅ හුස්නී, වදහාබ හම්මී."
(අහෝ දෙවිඳුනි! සැබැවින්ම මම ඔබගේ වහලෙකු වෙමි. ඔබගේ වහලෙකුගේ පුත්රයා මෙන්ම ඔබගේ වහලියකගේ පුත්රයා වෙමි. මාගේ නළලත ඔබ අතෙහිය. මා සම්බන්ධයෙන් ඔබගේ නීතිය ක්රියාත්මක වේ. මා සම්බන්ධයෙන් ඔබගේ නියෝගය සාධාරණය. ඔබ විසින්ම නම් කරන ලද හෝ ඔබගේ ඕනෑම නිර්මාණයකට ඉගැන්වූ හෝ ඔබේ ග් රන්ථයේ පහළ කළ හෝ ඔබ සමඟ පවතින ගුප්ත දැනුමෙහි ඒකාධිකාරී වූ හෝ ඔබටම තබා ගත් ඔබට අයත් සෑම නාමයකින්ම මම ඔබෙන් ඉල්ලා සිටිම: අල්-කුර්ආනය මගේ හදවතේ වසන්තය ලෙසත් මගේ සිතෙහි ආලෝකය ලෙසත් මගේ දුක දුරු කරන්නක් ලෙසත්, මගේ කරදර පහ කරන්නක් ලෙසත් මට නියම කරනු මැනව!)



18 "අල්ලාහුම්ම මුසර්රිෆල් කුලූබ්, සර්රිෆ් කුලූබනා අලා තාඅතික"
(අහෝ හදවත් වෙනස් කරන්නානනි! අපගේ හදවත් ඔබට අවනත වීමට යොමු කරනු මැනව!)

19 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ආෆියත ෆිද් දුන්යා වල් ආකිඃරා"
(අහෝ දෙවිඳුනි! මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි සුවය, ආරෝග්යය මම ඔබෙන් පතමි.)

20 "අල්ලාහුම්ම අහ්සින් ආකිබතනා ෆිල් උමූරි කුල්ලිහා, වඅජිර්නා මින් හිඃද්යිද් දුන්යා වඅදාබිල් ආහිඃරා"
(අහෝ දෙවිඳුනි! සියලු කාරණාවලදී අපගේ අවසානය යහපත් කර, මෙලොව නින්දාවෙන් හා පරලොව දඬුවමෙන් අපව මුදවා ගනු මැනව!)

21 "රබ්බි අඉන්නී වලා තුඉන් අලය්ය. වන්සුර්නී වලා තන්සුර් අලය්ය, වම්කුර්ලී වලා තම්කුර් අලය්ය, වහ්දිනී, වයස්සිරිල් හුදා ඉලය්ය, වන්සුර්නී අලා මන් බගා අලය්ය"
(මාගේ පරමාධිපතියාණනි! මට උදව් කරනු මැනව, මට විරුද්ධව උදව් නොකරනු මැනව. මට සහාය දෙනු මැනව, මට විරුද්ධව සහය නොදෙනු මැනව! මා වෙනුවෙන් සැලසුම් කරනු මැනව, මට විරුද්ධව සැලසුම් නොකරනු මැනව! මට මග පෙන්වනු මැනව! යහමග මට පහසු කර දෙනු මැනව! මට අපරාධ කරන අයට එරෙහිව මට උදව් කරනු මැනව!)

**22**

"රබ්බිජ්අල්නී ලක ෂක්කාරන්, ලක දක්කාරන්, රහ්හාබන්, ලක මිත්වාඅන්, ඉලයික මුක්බිතන් අව්වාහන් මුනීබා."
(මාගේ පරමාධිපතියාණනි! ඔබට බොහෝ සේ කෘතඥ වන, ඔබව අධික ලෙස සිහි කරන, ඔබට බිය වන, ඔබට කීකරු වන, ඔබට යටත් වන, භක්තිමත් ලෙස පසුතැවිලි වන සහ (22) ඔබ වෙත යොමු වන අයකු බවට මාව පත් කරනු මැනව!)

23 "රබ්බි තකබ්බල් තව්බතී, වග්සිල් හව්බතී, වඅජිබ් දඃවතී, වසබ්බිත් හුජ්ජතී, වහ්දි කල්බී, වසද්දිද් ලිසානී, වස්ලුල් සඛීඃමත කල්බී"
(මාගේ පරමාධිපතියාණනි! මාගේ පශ්චාත්තාපය පිළිගනු මැනව!, මාගේ පාපය සෝදා හරිනු මැනව!, මාගේ යාච්ඤාවට පිළිතුරු දෙනු මැනව!, මාගේ තර්කය ශක්තිමත් කරනු මැනව!, මාගේ සිතට මඟ පෙන්වනු මැනව!, මාගේ දිව මෙහෙයවනු මැනව!, මාගේ සිතෙන් ද්වේෂය ඉවත් කරනු මැනව!)

24 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ෂර්රි සම්ඊ, වමින් ෂර්රි බසරී, වමින් ෂර්රි ලිසානී, වමින් ෂර්රි කල්බී, වමින් ෂර්රි මනිය්යී"(2)
(අහෝ දෙවිඳුනි! මාගේ ශ්‍රවණයේ නපුරෙන්, මාගේ දෘෂ්ටියේ නපුරෙන්, මාගේ දිවේ නපුරෙන්, මාගේ සිතේ නපුරෙන් සහ මාගේ ශුක්‍ර තරලයේ නපුරෙන් මම ඔබගෙම ආරක්ෂාව පතමි.)

25 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් බරසි, වල් ජුනූනි, වල් ජුදාමි(3) වමින් සය්යිඉල් අස්කාමි"
(අහෝ දෙවිඳුනි! කුෂ්ඨ රෝගය, උමතුව, සහ ලාදුරු වැනි රෝග සහ සියලු නපුරු මාරාන්තික රෝගවලින් මම ඔබගෙන් රැකවරණය පතමි.)

26 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් මුන්කරාතිල් අඛ්ලාකි, වල් අඃමාලි, වල් අහ්වාඉ"
(අහෝ දෙවිඳුනි! පිළිකුල් සහගත ගතිපැවතුම්, ක්‍රියාවන් හා ආශාවන්ගෙන් රැකවරණය මම ඔබෙන් පතමි.)

2- මළ්හරී තුමා මෙසේ පවසයි: "ශුක්‍ර තරලයේ නපුරෙන්" යනු මා දුරාචාරයේ හා තහනම් දෑ දෙස බැලීමෙහි නිරත වීමෙන් ආරක්ෂාව පතමි යන්නයි. 'කුව්වතුල් මුග්තදී අලා ජාමිඉත් තිර්මිදී" (2/860)
3- සිරුරේ මස් පිඩු කා දමන, පැතිරෙන ප්‍රසිද්ධ රෝගයකි. අල්ලාහ් අප ඉන් ආරක්ෂා කරත්වා! 'ඉබ්නු රුස්ලාන්'ගේ ෂර්හු සුනනු අබී දාවුද් (7/411)

27 "අල්ලාහුම්ම ඉන්නක අෆුව්වුන් කරීමුන් තුහිබ්බුල් අෆ්ව ෆඃෆු අන්නී"
(අහෝ දෙවිඳුනි! සැබැවින්ම ඔබ ක්ෂමාශීලීය, ත්‍යාගශීලීය. සමාව දීම ඔබ ප්‍රිය කරන්නෙහිය. එබැවින් මට සමාව දෙනු මැනව!)

28 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ෆිඃලල් හඃය්රාති, වතර්කල් මුන්කරාති, වහුබ්බල් මසාකීනි, වඅන් තග්ෆිර ලී වතර්හමනී, වඉදා අරද්ත ෆිත්නතන් ෆී කව්මින් ෆතවෆ්ෆනී ගයිර මෆ්තූනින්, වඅස්අලුක හුබ්බක වහුබ්බ මන් යුහිබ්බුක, වහුබ්බ අමලින් යුකර්රිබුනී ඉලා හුබ්බික."
(අහෝ දෙවිඳුනි! යහපත් ක්‍රියා කිරීමට, නපුරු ක්‍රියා අත් හැරීමට, දුප්පතුන්ට ආදරය කිරීමට සහ ඔබ මට සමාව දී මට අනුකම්පා කිරීමට මම ඔබෙන් ඉල්ලා සිටිමි. ඔබ ප්‍රජාවක් පරීක්ෂාවට ලක් කිරීමට අදහස් කරන්නේ නම්, මා පරීක්ෂාවට ලක් කිරීමට පෙර මාව භාර ගන්න. ඔබේ ආදරය ඔබට ආදරය කරන අයගේ ආදරය සහ ඔබේ ආදරයට මා සමීප කරන ක්‍රියාවන් කෙරෙහි ඇති ආදරය මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

29 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මිනල් හඃයිරි කුල්ලිහී ආජිලිහි වආජිලිහි මා අලිම්තු මින්හු වමා ලම් අඃලම්, වඅඌදුබික මිනෂ් ෂර්රි කුල්ලිහි ආජිලිහි වආජිලිහි මා අලිම්තු මින්හු වමා ලම් අඃලම්."
(අහෝ දෙවිඳුනි! වර්තමානයේ හා ආනගතයේ සිදුවන මා නොදැන සිටි නමුත් ඔබ ඒ ගැන දැන සිටි සියලුම යහපත මම ඔබෙන් ඉල්ලමි. අහෝ දෙවිඳුනි! වර්තමානයේ හා ආනගතයේ සිදුවන මා නොදැන සිටි නමුත් ඔබ ඒ ගැන දැන සිටි සියලුම නපුරෙන් ආරක්ෂාව මම ඔබෙන් ඉල්ලමි.)

30 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් හඃයිරි මා සඅලක අබ්දුක ව නබිය්යුක, වඅඌදු බික මින් ෂර්රි මා ආද බිහි අබ්දුක ව නබිය්යුක"
(අහෝ දෙවිඳුනි! ඔබේ ගැත්තා ඔබේ නබිවරයා ඔබෙන් කවර කරුණක් ඉල්ලා සිටියේ ද එහි යහපත මම ඔබෙන් අයැදමි. ඔබේ ගැත්තා ඔබේ නබිවරයා ඔබෙන් කවර කරුණකින් ආරක්ෂාව පැතුවේ ද එහි හානියෙන් ආරක්ෂාව මම ඔබෙන් පතමි.)

31 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ජන්නත, වමා කර්රබ ඉලයිහා මින් කව්ලින් අව් අමලින්, වඅඌදු බික මිනන් නාරි, වමා කර්රබ මින්හා මින් කවුලින් අව් අමලින්, වඅස්අලුක අන් තජ්අල කුල්ල කළාඉන් කළයිතහූ ලී හඃයිරා"

(අහෝ දෙවිඳුනි! ස්වර්ගය හා ඒ වෙත සමීප කරවන වචනයක් හෝ ක්‍රියාවක් හෝ වේවා එය ද මම ඔබෙන් පතමි. අපා ගින්නෙන් සහ ඒ වෙත සමීප කරවන වචනයක් හෝ ක්‍රියාවක් හෝ වේවා එයින් මම ඔබෙන් ආරක්ෂාව පතමි. ඔබ මා වෙනුවෙන් නියම කළ සෑම නියෝගයක්ම යහපත් කර දෙන මෙන් මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

32 "අල්ලාහුම්මහ්ෆළ්නී බිල් ඉස්ලාමි කාඉමා, වහ්ෆළ්නී බිල් ඉස්ලාමි කාඉදා, වහ්ෆළ්නී බිල් ඉස්ලාමි රාකිදා, වලා තුෂ්මිත් බී අදුව්වන් වලා හාසිදා"

(අහෝ දෙවිඳුනි! මා සිටගෙන සිටින විට ඉස්ලාමය තුළින් මා ආරක්ෂා කරනු මැනව!, මම වාඩි වී සිටින විට ඉස්ලාමය තුළින් මා ආරක්ෂා කරනු මැනව! මම නිදා සිටින විට ඉස්ලාමය තුළින් මා ආරක්ෂා කරනු මැනව! සතුරෙකුට හෝ ඊර්ෂ්‍යා කරන පුද්ගලයෙකුට මා කෙරෙහි උදම් ඇනීමට ඉඩ නොතබන්න.)

33 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් කුල්ලි හඃයිරින් හඃසාඉනුහූ බියදික, වඅඌදු බික මින් කුල්ලි ෂර්රින් හඃසාඉනුහු බියදික"

(අහෝ දෙවිඳුනි! ඔබේ අතේ ගබඩා කර ඇති සෑම යහපතකින්ම මම ඔබෙන් අයදින අතර, ඔබේ අතේ ගබඩා කර ඇති සෑම නපුරකින්ම මම ඔබෙන් ආරක්ෂාව පතමි.)

34 **"අල්ලාහුම්මක්සිම් ලනා මින් හඃෂ්යතික මා යහූලු බය්නනා වබයින මආසීක, වමින් තාඅතික මා තුබල්ලිග්නා බිහී ජන්නතක, වමිනල් යකීනි මා තුහව්විනු අලයිනා මසාඉබද් දුන්යා"**

**(අහෝ දෙවිඳුනි! අප සහ ඔබට අකීකරුවීම අතර පවතින දෑ පිළිබඳ ඔබ කෙරෙහි ඇති බිය, ඔබේ ස්වර්ගයට අපව රැගෙන යන ඔබට කීකරු වීම සහ මෙලොව විපත් අපට පහසු කරවන නිශ්චිතභාවය අපට ලබා දෙනු මැනව!)**

35

"අල්ලාහුම්ම මත්තිඃනා බි අස්මාඉනා වඅබ්සාරිනා, වකුව්වතිනා මා අහ්යය්තනා, වජ්අල්හුල් වාරිස මින්නා, වජ්අල් සඃරනා අලා මන් ළලමනා, වන්සුර්නා අලා මන් ආදානා, වලා තජ්අල් මුසීබතනා ෆී දීනිනා, වලා තජ්අලිද් දුන්යා අක්බර හම්මිනා, වලා මබ්ලග ඉල්මිනා, වලා තුසල්ලිත් අලයිනා මන් ලා යර්හම්නා"

(අහෝ දෙවිඳුනි! ඔබ අපව ජීවත් කරවන තාක් කල්, අපගේ ශ්‍රවණය, අපගේ පෙනීම සහ අපගේ ශක්තිය භුක්ති විඳින්නට ඉඩ සළසනු මැනව! එය අපගෙන් වූ උරුමක්කාරයා බවට පත් කරනු මැනව! අපට අපරාධ කළ අයට අපගේ ප්‍රතිචාරය දක්වා අපට සතුරු වූවන්ට එරෙහිව අපට ජයග්‍රහණය ලබා දෙනු මැනව! අපගේ දහම තුළ අපගේ විපත පත් නොකරනු මැනව! මෙලොව අපගේ විශාලතම අරමුණ බවට හෝ අපගේ දැනුමේ ප්‍රමාණය බවට පත් නො කරනු මැනව!, අපට අනුකම්පා නොකරන අය අප කෙරෙහි ආධිපත්‍ය දරන්නට ඉඩ නො සළසනු මැනව!) [4]

36 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් ජුබුනි, වඅඌදු බික මිනල් බුහ්ඃලි, වඅඌදු බික අන් උරද්ද ඉලා අර්දලිල් උම්රි, වඅඌදු බික මින් ෆිත්නතිද් දුන්යා වඅදාබිල් කබ්රි"

(අහෝ දෙවිඳුනි, බියගුලුකමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි, මසුරුකමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි, ජීවිතයේ නරකම (වයෝවෘද්ධ) කාලයට යොමු වීමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි, මෙලොව අර්බුද සහ මිනී වළෙහි දඬුවමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)

4- ඉන් අදහස් කරනුයේ: මරණ මොහොත පැමිණෙන තෙක් අපගේ අනෙකුත් අවයව දුර්වල වීමෙන් පසුව අපගේ ශ්‍රවණ හා දෘෂ්ටි ශක්තිය අප වෙත දිගටම පැවතෙන්නට ඉඩ හරින්වා යන්නයි. 'අල්-මෆාතීහු ෆී ෂර්හිල් මසාබීහ්' (3/248)

37 "අල්ලාහුම්මග්ෆිර්ලී කතීඅතී! වජහ්ලී, වඉස්රාෆී ෆී අම්රී, වමා අන්ත අඃලමු බිහී මින්නී, අල්ලාහුම්මග්ෆිර්ලී ජිද්දී, වහද්ලී, වකතඊ, වඅම්දී, වකුල්ලු දාලික ඉන්දී"

(අහෝ දෙවිඳුනි, මාගේ පාපයට, මාගේ නොදැනුවත්කමට, මාගේ කටයුතුවල අධික වියදම්වලට සහ ඔබ මට වඩා හොඳින් දන්නා දේට සමාව දෙනු මැනව!. අහෝ දෙවිඳුනි! මාගේ බැරෑරුම්කමට, මාගේ විහිළුවට, මාගේ වැරදිවලට සහ මාගේ හිතාමතා කළ ක්‍රියාවන්ට සමාව දෙනු මැනව! මන්ද ඒ සියල්ල මා තුළ තිබිණ.)



38 "අල්ලාහුම්මග් ෆිර්ලී වර්හම්නී වහ්දිනී වආෆිනී වර්සුක්නී"

(අහෝ දෙවිඳුනි! මට සමාව දෙනු මැනව! මට කරුණා කරනු මැනව! මට යහමග පෙන්වනු මැනව! මට සුවය හා සෞභාග්‍ය දෙනු මැනව! මට පෝෂණය දෙනු මැනව!)

39 "අල්ලාහුම්ම ඉන්නී ළලම්තු නෆ්සියි, ළුල්මන් කසීරා, වලා යඃෆිරුද්දුනූබ ඉල්ලා අන්ත, ෆග්ෆිර්ලී මග්ෆිරතන් මින් ඉන්දික්, වර්හම්නි ඉන්නක අන්තල් ගෆූරුර් රහීම්"

(අහෝ දෙවිඳුනි! සැබැවින්ම මම මට ම බොහෝ අපරාධ කරගෙන ඇත්තෙමි. ඒ සඳහා පාපක්ෂමාව ලබා දීමට ඔබ හැර වෙනත් කිසිවකු නොමැත. එබැවින් ඔබ වෙතින් වූ සමාවක් වශයෙන් ඔබ මාගේ පාපයන් කමා කරනු මැනව! මා හට කරුණාව දක්වනු මැනව! සැබිවින් ම ඔබ මහා කාරුණික හා පාපක්ෂමාව ලබා දෙන්නා ය.)

40 "අල්ලාහුම්ම ලක අස්ලම්තු වබික ආමන්තු වඅලයික තවක්කල්තු වඉලයික අනබ්තු වබික ාසම්තු"

(අහෝ දෙවිඳුනි! මම ඔබට යටත් වෙමි, ඔබ කෙරෙහි මම විශ්වාස කරමි, ඔබ කෙරෙහි මම විශ්වාසය තබමි, ඔබ වෙත හැරෙමි, ඔබ තුළින් මම තර්ක කරමි.)

41 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බිඉද්දතික, ලා ඉලාහ ඉල්ලා අන්ත අන් තුළිල්ලනී, අන්තල් හය්යුල්ලදී ලා තමූත, වල් ජින්නු වල් ඉන්සු යමූතූන." (අහෝ දෙවිඳුනි, ඔබගේ තේජසින් මම ආරක්ෂාව පතමි. ඔබ හැර වෙනත් දෙවියෙකු නැත, ඔබ මාව නොමඟ යවනු ඇත. ඔබ මිය නොයන සදාකාලික ජීවමානය, ජින්වරුන් සහ මිනිසුන් මිය යති.)

42

**"අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මූජිබාති රහ්මතික,(5) වඅසාඉම මග්ෆිරතික,(6) වස්-සලාමතු මින් කුල්ලි ඉස්මින්, වල් ගනීමතු මින් කුල්ලි බිර්රින්, වල් ෆව්ස බිල් ජන්නති, වන්-නජාත මිනන් නාරි"**

**(අහෝ දෙවිඳුනි, ඔබගේ දයාව නියම කරන දෙන දෑ ද ඔබගේ සමාව දීමේ අධිෂ්ඨානය ද, සෑම පාපයකින්ම ආරක්ෂාව ද සෑම යහපත් ක්රියාවක්ම අත්කර ගැනීම ද ස්වර්ගය අත්කර ගැනීම සහ අපා ගින්නෙන් ගැලවීම ද මම ඔබෙන් ඉල්ලා සිටිමි.)**

5- (අල්අසාඉම්): අසීමා යන පදයේ බහු වචනයයි. මිනිසා අධිෂ්ඨාන කරන කරුණය. එනම් ඔහු අපේක්ෂා කරන දෑය. හදවතින් අපේක්ෂා කර එහි උත්සාහය දැරීමය. එනම් ඔබේ සමාව ලැබීමට හේතුවන කරුණු මම ඔබෙන් ඉල්ලා සිටිමි යන්නයි. 'අල්-මෆාතීහු ෆී ෂර්හිල් මසාබීහ්' (2/304)

6- එනම්: ඔබේ කරුණාව හා ආශිර්වාදය හිමි කර දෙන ක්රියා, ප්රකාශ හා ගුණාංග වේ. 'අල්-මෆාතීහු ෆී ෂර්හිල් මසාබීහ්' (2/304)

43 "අල්ලාහුම්මග්ෆිර්ලී දන්බී, වවස්සිඃ ලී ෆී දාරී, වබාරික් ලී ෆී රිස්කී"
(අහෝ දෙවිඳුනි! මාගේ පව්වලට සමාව දෙනු මැනව! මාගේ නිවසෙයි විස්තීරණභාවය ලබා දෙනු මැනව! මාගේ ජීවනෝපායෙහි මට සමෘද්ධිය ලබා දෙනු මැනව!)

44 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් ෆළ්ලික වරහ්මතික, ෆඉන්නහූ ලා යම්ලිකුහා ඉල්ලා අන්ත"
(අහෝ දෙවිඳුනි, මම ඔබෙන් ඔබගේ භාග්‍යය සහ දයාව ඉල්ලා සිටිමි, මන්ද ඔබ හැර වෙන කිසිවෙකු ඒවා සතු කර නොගනී.)

45 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනත් තරද්දී, වල් හදම්, වල් ගරකි, වල් හරකි, වඅඌදු බික අය් යතහඃබ්බතනී අෂ්-ෂෙයිතානු ඉන්දල් මව්ති, වඅඌදු බික අන් අමූත ෆී සබීලික මුද්බිරා, වඅඌදු බික අන් අමූතු ලදීගා"
(අහෝ දෙවිඳුනි, පැටලී බිම ඇද වැටීමෙන්, ගොඩනැගිලි කඩා වැටීමෙන්, දියේ ගිලීයාමෙන් සහ පිළිස්සීයාමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි. මරණාසන්න මොහොතේ ෂෙයිතාන්ගේ පීඩාවන්ගෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි. ඔබගේ මාර්ගයේ ද් රෝහියෙකු ලෙස මිය යාමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි. සර්පයෙකු දෂ්ට කිරීමෙන් මිය යාමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)

46 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් ජූඉ, ෆඉන්නහූ බිඃසල් ළජීඋ, වඅඌදු බික මිනල් හිඃයානති ෆඉන්නහා බිඃසත් අල් බිතානතු"
(අහෝ දෙවිඳුනි, කුසගින්නෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි, මන්ද එය නපුරු ඇඳ මිතුරෙකි. ද්රෝහිකමෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි, මන්ද එය නපුරු සමීපතයෙකි.)



47 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල්අජ්සි, වල්කසලි, වල්ජුබ්නි, වල්බුඛ්ලි වල් හරමි, වල් කස්වති, වල් ගෆ්ලති, වල්-අයිලති,(7) වද්-දිල්ලති, වල්-මස්කනති, වඅඌදු බික මිනල්-ෆක්රි, වල්-කුෆ්රි, වල්-ෆුසූකි, වෂ්-ෂිකාකි, වන්-නිෆාකි, වස්-සුම්අති, වර්-රියාඉ, වඅඌදු බික මිනස්-සමමි, වල්-බකමි, වල්-ජුනූනි, වල්-ජුදාමි, වල්-බරසි, වසය්යිඉල් අස්කාමි"

(අහෝ දෙවිඳුනි! නො හැකියාව, කම්මැලිකම, බියගුලුකම, මසුරුකම, වයෝවෘද්ධභාවය, කෘෂරත්වය, නොසැලකිලිමත්කම, දරිද්රතාවය, නින්දාව සහ අසරණභාවයෙන් මම ඔබගෙන් රැකවරණය පතමි. දුප්පත්කම, අවිශ්වාසය, දුරාචාරය, අසමගිය, කුහකකම, ප්රසිද්ධ සහ ප් රදර්ශනය කිරීම යන දැයින් මම ඔබගෙන් රැකවරණය පතමි. බිහිරි බව, ගොළුකම, පිස්සුව, ලාදුරු, සුදු කබර සහ සියලු නපුරු රෝගවලින් මම ඔබගෙන් රැකවරණය පතමි.)

48 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් ෆක්රි, වල්-කිල්ලති, වද්-දිල්ලති, වඅඌදු බික මින් අන් අළ්ලිම අව් උළ්ලම"

(අහෝ දෙවිඳුනි, දිළිඳුකමෙන්, අගහිඟකමෙන් සහ නින්දාවෙන් මම ඔබගෙන් රැකවරණය පතමි. පීඩාවෙන් හෝ පීඩාවට පත්වීමෙන් මම ඔබගෙන් රැකවරණය පතමි.)



7- අල්-අයිලා (දරිද්රතාව) යනු දිළිඳුකමය. 'අල්-මුඅල්ලිමු බිෆවාඉදි මුස්ලිම්' (1/297

49 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ජාරිස්-සූඉ ෆී දාරිල් මුකාමති, ෆඉන්න ජාරල් බාදියති යතහව්වලු"

(අහෝ දෙවිඳුනි! පදිංචි ස්ථානයේ සිටින නරක අසල්වැසියාගෙන් ආරක්ෂාව මම ඔබගෙන් පතමි. මක්නිසාද යත් ගම්බද අසල්වැසියා වෙනස් විය හැකි බැවිනි.)

50 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් කල්බින් ලා යඛ්ෂඃ, වමින් නෆ්සින් ලා තෂ්බඃ, වමින් දුආඉන් ලා යුස්මඃ, වමින් ඉල්මින් ලා යන්ෆඃ. අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් හාඋලාඉල් අර්බඃ"

(අහෝ දෙවිඳුනි! ඔබට බිය නොවන හදවතකින්, කිසිදා තෘප්තිමත් නොවන ආත්මයකින්, සවන් නොදෙන ප්‍රාර්ථනාවකින් සහ කිසිදු ප්‍රයෝජනයක් නොමැති දැනුමකින් මම ඔබගෙන් රැකවරණය පතමි. අහෝ දෙවිඳුනි, මෙම කරුණු හතරෙන් මම ඔබගෙන් රැකවරණය පතමි.)

51 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් යව්මිස් සූඉ, වමින් ලය්ලතිස් සූඉ, වමින් සාඉතිස් සූඉ, වමින් සාහිබිස් සූඉ, වමින් ජාරිස් සූඉ ෆී දාරිල් මුකාමා"

(අහෝ දෙවිඳුනි! නපුරු දිනයකින්, නපුරු රාත්‍රියකින්, නපුරු හෝරාවකින්, නපුරු සහකරුවකුගෙන් සහ මෙම නවාතැනෙහි නපුරු අසල්වැසියකුගෙන් මම ඔබගෙන් ආරක්ෂාව පතමි.)

52 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ජන්නත වඅස්තජීරු බික මිනන්-නාරි"

(අහෝ දෙවිඳුනි! නියත වශයෙන්ම මම ඔබෙන් ස්වර්ගය අයැදින අතර අපා ගින්නෙන් ආරක්ෂාව ද ඔබෙන් පතමි.)

53 "අල්ලාහුම්ම ෆක්කිහ්නී ෆිද් දීන්"

(අහෝ දෙවියනි! මට දහම තුළ අවබෝධය ලබා දෙනු මැනව!)

54 "අල්ලාහුම්ම ඉන්නී අඌදුබික අන් උෂ්රික බික වඅන අඃලමු, වඅස්තග්ෆිරුක ලිමා ලා අඃලමු."

(අහෝ දෙවිඳුනි, මම දැනුවත්වම ඔබට (කිසිවක් හෝ කිසිවෙක්) සමකිරීමෙන් මා ආරක්ෂා කරනු මැනව! තවද මගෙන් නොදැනුවත්ව සිදුවූ පව්වලට මම ඔබෙන් සමාව ඉල්ලා සිටිමි.)

55 "අල්ලාහුම්මන්ෆඃනී බිමා අල්ලම්තනී, වඅල්ලිම්නී මා යන්ෆඋනී, වසිද්නී ඉල්මා"
(ඔබ මාහට ඉගැන්වූ දැයින් මට ප්රයෝජනය දෙනු මැනව! මට ප්රයෝජනවත් වන දෑ ඔබ මට උගන්වනු මැනව! තවද මට ප්රයෝජනවත් වන දැනුමින් මා පෝෂණය කරනු මැනව.)

56 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඉල්මන් නාෆිඅන්, වරිස්කන් තයියිබන් වඅමලන් මුතකබ්බලන්."
(අහෝ දෙවිඳුනි! ප්රයෝජනයක් ඇති දැනුම ද, ගුණවත් පෝෂණය ද, පිළිගනු ලබන්නාවූ ක්රියාව ද මම ඔබගෙන් අයද සිටිමි.)



57 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක යා අල්ලාහ් බිඅන්නකල් වාහිදුල් අහදුස් සමදුල්ලදී ලම් යලිද් වලම් යූලද් වලම් යකුල් ලහූ කුෆුවන් අහද් අන්-තග්ෆිර්ලී දුනූබී, ඉන්නක අන්තල් ගෆූරුර් රහීම්."
(අහෝ දෙවිඳුනි! සැබැවින්ම ඔබගෙන්ම අයද සිටිමි යා අල්ලාහ්, ඔබ කිසිදු අවශ්යතාවක් නැති ඒකීයය. ඔහු (අල්ලාහ්) ජනිත නො කළේය. තවද ජනිත කරනු නොලැබුවේ ය. ඔහුට සමාන කිසිවෙක් නැත. මාගේ සියලු පාපයන් සඳහා ක්ෂමා කරන මෙන් ඔබෙන් අයද සිටිමි. ඇත්ත වශයෙන්ම ඔබ කමා කරන්නාය. මහා කාරුණිකය.)



58 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක බිඅන්න ලකල් හම්ද, ලා ඉලාහ ඉල්ලා අන්ත, වහ්දක ලා ෂරීකලක, අල් මන්නානු යා බදීඅස් සමාවාති වල් අර්ලි, යා දල් ජලාලි වල් ඉක්රාම්, යා හය්යු යා කය්යූමු ඉන්නී අස්අලුකල් ජන්නත වඅඌදුබික මිනන්නාර්."

(අහෝ දෙවිඳුනි! නිසැකවම, සියලු ප්රශංසා ඔබටම හිමිවන නිසාවෙන් ඔබෙන් මම ඉල්ලා සිටිමි. නැමදීමට සුදුස්සා ඔබ හැර වෙන කිසිවෙකු නැත. ඔබ ඒකීයය. ඔබට කිසිදු හවුල් කරුවෙකු නැත, තවද, අසීමිත ලෙස දායාදය ලබා දෙන්නා ඔබය. අහස් හා පොළොවේ මැවුම්කරුවාණනි! ගෞරවයෙහි සහ මහිමයෙහි හිමිකරුවාණනි! නිත්ය ජීවමාන වූ, සදා කාලීනව සිටින්නාණනි, මම ඔබෙන් ස්වර්ගය අයැද සිටිමි. තවද නිරයෙන් ආරක්ෂාව පතමි.)

59 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක බිඅන්නී අෂ්හදු අන්නක අන්තල්ලාහ්, ලා ඉලාහ ඉල්ලා අන්තල් අහදුස් සමදුල්ලදී ලම් යලිද් වලම් යූලද් වලම් යකුන් ලහූ කුෆුවන් අහද්"

(අහෝ දෙවිඳුනි! නිසැකවම ඔබම ය අල්ලාහ්, නැමදීමට සුදුස්සා ඔබ හැර අන් කිසිවකු නැත. ඔබ ඒකීයය, කිසිම අවශ්යතාවයක් නොමැත්තා ය. ඔහු ජනිත නො කළේය. තවද ජනිත කරනු නො ලැබුවේය. ඔහුට සමාන කිසිවෙක් නැත. ඒ ගැන මා මෙසේ සාක්ෂි දරමින් ඔබෙන් අයැද සිටිමි.)

60 "රබ්බිග් ෆිර්ලී වතුබ් අලෙයිය ඉන්නක අන්තත් තව්වාබුල් ගෆූර්"
(මාගේ පරමාධිපතියාණනි! මට සමාව දෙනු මැනව! මගේ පාපොච්චරණය පිළිගනු මැනව! නියත වශයෙන් ඔබ පාපොච්චරණය පිළිගන්නාය. අති ක්ෂමාශීලීය.)

61 "අල්ලාහුම්ම බිඉල්මිකල් ගයිබ්, වකුද්රතික අලල් කල්කි, අහ්යිනී මා අලිම්තල් හයාත හෑයිරන් ලී, වතවප්ෆනී ඉදා අලිම්තල් වෆාත කයිරන් ලී"
(අහෝ දෙවිඳුනි! ඔබගේ අදෘශ්‍යමාන දැනුමෙන් සහ මැවීම කෙරෙහි ඔබගේ බලයෙන්, ජීවිතය මට යහපතක් බව ඔබ දන්නා තාක් කල් මා ජීවත් කරනු මැනව! මරණය මට යහපතක් බව ඔබ දන්නා විට මාව අත්පත්කර ගනු මැනව!)

62 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හෑෂ්යතක ෆිල් ගයිබි වෂ්ෂහාදති, වඅස්අලුක කලිමතල් හක්කි ෆිර්රිළා වල්ගළබ්, වඅස්අලුකල් කස්ද ෆිල් ෆක්රි වල් ගිනා, වඅස්අලුක නර්මන් ලා යන්ෆදු, වඅස්අලූක කුර්රත අයිනින් ලා තන්කතිඋ, වඅස්අලූකර් රිළාඅ බෑදල් කළාඉ, වඅස්අලුක බර්දල් අයිෂි බෑදල් මව්ති, වඅස්අලූක ලද්දතන් නළරි ඉලා වජ්හික, වෂ්-ෂව්ක ඉලා ලිකාඉක ෆී ගයිරි ළර්රාඅ මුළිර්රතින්, වලා ෆිත්නතින් මුළිල්ලතින්"
"අහෝ දෙවිඳුනි! මා තනිව සිටින විට ද අනුන් ඉදිරියේ සිටින විට ද ඔබට බියබැතියෙන් යුතුව ජීවත්වීමට පතමි. මා තෘප්තිමත්ව සිටින විට ද කෝප වී සිටින විට ද සත්‍ය වදන්ම කතා කිරීමට මා ඔබෙන් පතමි. ධන බලය තිබෙන විට ද දුගී භාවය ඇති විට ද මැද පිළිවෙතක් අනුගමනය කිරීමට මම ඔබගෙන් අයැද සිටිමි. අසීමිත දායාදය ද මම ඔබෙන් ඉල්ලා සිටිමි. මගේ දෑසට නොසන්සිඳින සිසිලසක් ලබා දෙන මෙන් අයැද සිටිමි. ඔබේ තීන්දුව ලැබීමෙන් පසු සෑහීමකට පත් වීමේ ශක්තියත්, මරණයෙන් මතු සුගතියෙන් යුතු ජීවිතයත් මම ඔබෙන් අයැද සිටිමි. ඔබේ මුහුණ බැලීමේ මිහිරි බව ද, කිසිදු හානිදායක බාධාවකින් හෝ අර්බුදයකින් තොරව ඔබව හමුවීමට ඇති ආශාව ද මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

63 "අල්ලාහුම්ම සය්යන්නා බිසීනතිල් ඊමානි, වජ්අල්නා හුදාතන් මුහ්තදීන්"
(අහෝ දෙවිඳුනි! විශ්වාසයේ අලංකාරයෙන් අපව අලංකාර කර, අපව මඟ පෙන්වන මාර්ගෝපදේශකයින් බවට පත් කරනු මැනව!)

64 "අල්ලාහුම්මර්සුක්නි හුබ්බක, වහුබ්බ මන් යන්ෆඋනී හුබ්බුහු ඉන්දක"
(අහෝ දෙවිඳුනි! ඔබගේ ආදරය සහ ඔබ කෙරෙහි ඇති ආදරය මට ප්‍රයෝජනවත් වන අයගේ ආදරය මට ලබා දෙනු මැනව!)

65 "අල්ලාහුම්ම මා රසක්තනී මිම්මා උහිබ්බු, ෆජ්අල්හු කුව්වතව් ලී ෆීමා තුහිබ්බු"
(අහෝ දෙවිඳුනි! මා ප්‍රිය කරන දැයින් ඔබ මට ලබා දී ඇති ඕනෑම දෙයක් වේවා, ඔබ එය ඔබ ප්‍රිය කරන දෑහි ශක්තියක් බවට පත් කරනු මැනව!)

66 "අල්ලාහුම්ම වමා සවය්ත අන්නී මිම්මා උහිබ්බු ෆජ්අල්හු ෆරාගන් ලී ෆීමා තුහිබ්බු"
(අහෝ දෙවිඳුනි! මා ප්‍රිය කරන දැයන් ඔබ මට වළක්වා ඇති ඕනෑම දෙයක් වේවා, ඔබ එය ප්‍රිය කරන දෑහි එය මට නිදහස් කර දෙනු මැනව!)

67 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් ජුබ්නි, වල් බුඛ්ලි වසූඉල් උමුරි, වෆිත්නතිස් සද්රි, වඅදාබිල් කබ්රි"
(අහෝ දෙවිඳුනි! බියගුලුකමෙන්, මසුරුකමෙන්, අයහපත් ආයුෂයෙන්, හදවත තුළ සිදුවන පරීක්ෂාවෙන් සහ මිනීවළේ දඬුවමින් ආරක්ෂාව මම ඔබගෙන් පතමි.)

68 "අල්ලාහුම්ම රබ්බ ජිබ්රාඊල, වමීකාඊල, වරබ්බ ඉස්රාෆීල, අඌදු බික මින් හර්රින් නාරි, වමින් අදාබිල් කබ්රි"
(අහෝ දෙවිඳුනි! ජිබ්රීල්, මීකාඊල්ගේ පරමාධිපතියාණනි! ඉස්රාෆීල්ගේ පරමාධිපතියාණනි! අපා ගින්නේ උනුසුමෙන් හා මිනීවළේ දඬුවමින් ආරක්ෂාව මම ඔබෙන් පතමි.

69 "අල්ලාහුම්ම අල්හිම්නී රුෂ්දී, වඅඉද්නී මින් ෂර්රි නෆ්සී"
(අහෝ දෙවිඳුනි! මට නිවැරදි දේ ආශිර්වාදයක් ලෙස ලබා දී මාගේ ආත්මයේ නපුරෙන් මා ආරක්ෂා කරනු මැනව!)

70 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඉල්මන් නාෆිආ, වඅඌදු බික මින් ඉල්මින් ලා යන්ෆඃ"
(අහෝ දෙවිඳුනි, ප්‍රයෝජනවත් දැනුම මම ඔබෙන් පතමි. ප්‍රයෝජනවත් නොවන දැනුමෙන් ආරක්ෂාව මම ඔබෙන් පතමි.)

71 "අල්ලාහුම්ම රබ්බස් සමාවාතිස් සබ්ඉ, වරබ්බල් අර්ළි, වරබ්බල් අර්ෂිල් අළීම්, රබ්බනා වරබ්බ කුල්ලි ෂෙයිඉන්, ෆාලිකල් හබ්බි වන්-නවා,[8] වමුන්සිලිත් තව්රාති, වල්-ඉන්ජීලි වල් ෆුර්කානි, අඌදු බික මින්



ෂර්රි කුල්ලි ෂෙයිඉන් අන්ත ආකිදුන් බිනාසියතිහි, අල්ලාහුම්ම අන්තල් අව්වලු, ෆලයිස කබ්ලක ෂෙයිඋන්, වඅන්තල් ආහිඃරු ෆලයිස බඃදක ෂෙයිඋන්, වඅන්තල් ළාහිරු ෆලයිස ෆව්කක ෂෙයිඋන්, වඅන්තල් බාතිනු ෆලයිස දූනක ෂෙයිඋන්, ඉක්ළි අන්නද් දීන, වඅග්නිනා මිනල් ෆක්රි" (අහෝ දෙවිඳුනි! අහස් හතෙහි පරමාධිපතියාණනි! පොළොවෙහි පරමාධිපතියාණනි! අති උත්තරීතර අර්ෂ්හි පරමාධිපතියාණනි! අපගේ මෙන්ම සියලූම වස්තුවල පරමාධිපතියාණනි! ඇට හා බීජ පලා ඒ තුලින් පැල මතු කරන්නාණනි! තව්රාත්, ඉන්ජීල් හා ෆුර්කාන් පහළ කළ පරමාධපතියාණනි! නළල් රොදින් ග්රහණය කරන ඔබගෙන් සෑම දෙයකින්ම විය හැකි උවදුරුවලින් ආරක්ෂා පතමි. අහෝ දෙවිඳුනි! පළමුවැන්නා ඔබය. ඔබට පෙර කිසිවක් නැත. අවසානයා ද ඔබ ය. ඔබට පසු කිසිවක් නැත. ඉහලින්ම ඉන්නේ ඔබයි. ඔබට ඉහලින් කිසිවක් නැත. පහළම ඉන්නේත් ඔබය. ඔබට පහළින් ද කිසිවක් නැත. ණය බර පියවා අප නිදහස් කරනු මැනව! දුගීභව තුරන් කර සුගතිය ලබා දෙනු මැනැව!)

8- එනම්: බීජය පළා ඉන් ධාන්යය මතු කිරීමය. 'නවාත්" (ඇටය) ඉන් රටඉඳි පැල වේ. 'අල් මුෆ්හිමු ලිමා අෂ්කල මින් තල්කීසි කිතාබි මුස්ලිම්' (7/41)

"අල්ලාහුම්ම අල්ලිෆ් බයින කුලූබිනා, වඅස්ලිහ් දාත බයිනිනා, වහ්දිනා සුබුලුස් සලාම්, වනජ්ජිනා මිනල් ළුලුමාති ඉලන් නූරි, වජන්නිබ්නා අල්-ෆවාහිෂ වල් ෆිත්න මා ළහර මින්හා වමා බතන්, වබාරික් ලනා ෆී අස්මාඉනා, වඅබ්සාරිනා, වකුලූබිනා, වඅස්වාජිනා, වදුර්රියයාතිනා, වතුබ් අලයිනා ඉන්නක අන්තත් තව්වාබුර් රහීම්, වජ්අල්නා ෂාකිරීන ලිනිඅමික, මුස්නීන බිහා අලයික, කාබිලීන ලහා, වඅත්මිම්හා අලයිනා"

(අහෝ දෙවිඳුනි! අපගේ හදවත් එක්සත් කරනු මැනව! අපගේ සබඳතා නිවැරදි කරනු මැනව! සාමයේ මාර්ගවලට අපව යොමු කරනු මැනව! අන්ධකාරයෙන් මුදවා ආලෝකය වෙතට යොමු කරනු මැනව! මතුපිටින් සහ අභ්‍යන්තරයෙන් සිදුවන අශිෂ්ටකම් සහ පීඩාවන්ගෙන් අපව ගලවා ගනු මැනව! අපගේ ශ්‍රවණය, අපගේ පෙනීම, අපගේ හදවත්, අපගේ කලත්‍රයන් සහ අපගේ දරුවන්ට ආශීර්වාද කරනු මැනව!. අපගේ පසුතැවිල්ල පිළිගනු මැනව! මන්ද ඔබ පසුතැවිල්ල පිළිගන්නා; මහා කාරුණිකය. ඔබගේ ආශිර්වාද සඳහා කෘතඥතාව පුද කරන්නන් බවටත් ඒ සඳහා ඔබව පැසසුම් කරන්නන් බවටත් එය පිළිගන්නන් බවටත් අප පත් කරනු මැනව! ඒවා අපට පූර්ණවත් කර දෙනු මැනව!)



73 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හෑයිරල් මස්අලති, වහෑයිරද් දුආඉ, වහෑයිරන් නජාහි, වහෑයිරල් අමලි, වහෑයිරස් සවාබි, වහෑයිරල් හයාති, වහෑයිරල් මමාති, වසබ්බිත්නී, වසක්කිල් මවාදීනී, වහක්කික් ඊමානී, වර්ෆෑ දරජාතී, වතකබ්බල් සලාතී, වග්ෆිර්ලී හෑතීඅතී, වඅස්අලුකද් දරජාතිල් උලා මිනල් ජන්නති"

(අහෝ දෙවිඳුනි! මම ඔබෙන් හොඳම ඉල්ලීම්, හොඳම අයැදුම්, හොඳම සාර්ථකත්වය, හොඳම ක්‍රියාව, හොඳම ප්‍රතිඵල, ජීවිතයේ හොඳම දේ සහ මරණයේ හොඳම දේ ඉල්ලා සිටිමි. මා ස්ථිර කරනු මැනව!, මගේ තරාදිය බර කරනු මැනව! මගේ විශ්වාසය සහතික කරනු මැනව! මගේ තත්වය උසස් කරනු මැනව! මගේ සලාතය පිළිගනු මැනව! මගේ වැරදිවලට සමාව දෙනු මැනව! තවද ස්වර්ගයේ ඉහළම තරාතිරම් මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

74 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ෆවාතිහල් හෑයිරි, වහෑවාතිමහූ, වජවාමිඅහූ, වඅව්වලහූ, වළාහිරහූ, වබාතිනහූ, වද්-දරජාතිල් උලා මිනල් ජන්නති."

(අහෝ දෙවිඳුනි! යහපතෙහි ආරම්භයන්, එහි අවසානයන්, එහි සමස්තතය එහි ආරම්භය, එහි බාහිරය හා අභ්‍යන්තරය ස්වර්ගයේ ඉහළම නිලය මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

75 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හෑයිර මා ආතී, වහෑයිර මා අෆ්අල්, වහෑයිර මා බතන්, වහෑයිර මා ළහර්, වද්දරජාතිල් උලා මිනල් ජන්නති."

(අහෝ දෙවිඳුනි! මා ගෙන එන දෙයින් හොඳම දේ, මා ක්‍රියා කරන දෙයින් හොඳම දේ, මා නැමදුම් ලෙස කරන දෙයින් හොඳම දේ, සැඟවුණු දෙයින් හොඳම දේ, පැහැදිලිව පෙනෙන දෙයින් හොඳම දේ සහ ස්වර්ගයේ ඉහළම තනතුරු මම ඔබෙන් අයදිමි.)

76 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක අන් තර්ෆඅ දික්රී, වතළඅ විස්රී, වතුස්ලිහ අම්රී, වතුතහ්හිර කල්බී, වතුහස්සින ෆර්ජී, වතුනව්විර කල්බී, වතග්ෆිර ලී දන්බී, වඅස්අලුකද් දරජාතිල් උලා මිනල් ජන්නති"

(අහෝ දෙවිඳුනි! මාගේ කීර්ති නාමය උසස් කරන ලෙසත්, මාගේ බර බැහැර කරන ලෙසත්, මාගේ කටයුතු නිවැරදි කරන ලෙසත්, මාගේ සිත පිරිසිදු කරන ලෙසත්, මාගේ රහස් අවයව ආරක්ෂා කරන ලෙසත්, මාගේ සිත ආලෝකවත් කරන ලෙසත්, මාගේ පාපයන්ට සමාව දෙන ලෙසත් මම ඔබෙන් ඉල්ලා සිටිමි. එමෙන්ම, ස්වර්ගයේ ඉහළම තනතුරු ද මම ඔබෙන් ඉල්ලා සිටිමි.)

77 අල්ලාහුම්ම ඉන්නී අස්අලුක අන් තුබාරක ෆී නෆ්සී, වෆී සම්ඊ, වෆී බසරී, වෆී රූහී, වෆී හෑල්කී, වෆී හුෑල්කී, වෆී අහ්ලී, වෆී මහ්යාය, වෆී මමාතී, වෆී අමලී, ෆතකබ්බල් හසනාතී, වඅස්අලුකද් දරජාතිල් උලා මිනල් ජන්නති."

(අහෝ දෙවිඳුනි! මාගේ ආත්මය, මාගේ ශ්‍රවණය, මාගේ පෙනීම, මාගේ ප්‍රාණය, මාගේ මැවීම, මාගේ චරිතය, මාගේ පවුල, මාගේ ජීවිතය, මාගේ මරණය සහ මාගේ ක්‍රියාව යනාදිය තුළ මට ආශිර්වාද කරන ලෙස මම ඔබෙන් අයදිමි. එබැවින් මාගේ යහපත් ක්‍රියාවන් පිළිගනු මැනව! තවද ස්වර්ගයේ ඉහළම නිලයන් මම ඔබෙන් අයැද සිටිමි.)

78 "අල්ලාහුම්ම ජන්නිබ්නී මුන්කරාතිල් අඛ්ෑලාකි, වල්-අඃමාලි, වල්-අහ්වාඉ, වල්-අද්වාඉ."

(අහෝ දෙවිඳුනි! නින්දිත සදාචාරයන්ගෙන්, ක්‍රියාවන්ගෙන්, ආශාවන්ගෙන් සහ රෝගවලින් මාව ආරක්ෂා කරනු මැනව!)

79 "අල්ලාහුම්ම කන්නිඃනී බිමා රසක්තනී, වබාරික් ලී ෆීහි, වහුෑලුෆ් අලය්ය කුල්ල ගාඉබතින් ලී බිඛයිරින්"

(අහෝ දෙවිඳුනි! ඔබ මට ලබා දුන් දෙයින් මට තෘප්තියක් ලබා දෙනු මැනව, එහි මට ආශිර්වාද කරනු මැනව! මාගෙන් සැඟවී ඇති සියල්ල වඩා හොඳින් ප්‍රතිස්ථාපනය කරනු මැනව!)

80 "අල්ලාහුම්ම හාසිබ්නී හිසාබන් යසීරා"

(අහෝ දෙවිඳුනි! මට පහසු ගණනය කිරීමක් ලබා දෙනු මැනව!)

81 **"අල්ලාහුම්ම අඉන්නී අලා දික්රික, වශුක්රික, වහුස්නි ඉබාදතික."**

**(අහෝ දෙවිඳුනි! ඔබව මෙනෙහි කරන්නට ද ඔබට තුති පුදන්නට ද අලංකාර ලෙස ඔබට නැමැදුම් කරන්නට ද මට උදව් කරනු මැනව!)**



82 "අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඊමානන් ලා යර්තද්දු, වනඊමන් ලා යන්ෆදු, වමුරාෆකත නබිය්යික මුහම්මදින් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් ෆී අඃලා ජන්නතිල් හුඃල්දි"
(අහෝ දෙවිඳුනි! නොසැලෙන විශ්වාසය, නිම නොවන ආශිර්වාදය සහ ස්වර්ගයේ ඉහළම නිලය තුළ ඔබගේ වක්තෘ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ ඇසුර මම ඔබෙන් අයදිමි.)

83 "අල්ලාහුම්ම කිනී ෂර්ර නෆ්සී, වඃසිම් ලී අලා අර්ෂදි අම්රී, අල්ලාහුම්මග්ෆිර්ලී මා අස්රර්තු, වමා අඃලන්තු, වමා අඃතඅතු, වමා අමද්තු, වමා අලිම්තු, වමා ජහිල්තු"
(අහෝ දෙවිඳුනි! මාගේ ආත්මයේ නපුරෙන් මා ආරක්ෂා කර, ඉතාමත් දැහැමි දෙය කිරීමට මා ශක්තිය ලබා දෙත්වා! අහෝ දෙවිඳුනි! මා රහසිගතව තබා ගත් දේ සහ මා ප්රසිද්ධ කළ දේ, මට වැරදී මා සිදු කළ දේ, මා හිතාමතා කළ දේ, මා දැන සිටි දේ සහ මා නොදැන සිටි දේ සඳහා මට සමාව දෙනු මැනව!)

84 "අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ගලබතිද් දයිනි, වගලබතිල් අදුව්වි, වෂමාතතිල් අඃදාඉ"
"අහෝ දෙවිඳුනි! ණය බරින් ද, සතුරා ඉක්මවා යාමෙන් ද, සතුරන් සතුටු වීමෙන් ද සැබැවින්ම මම ඔබෙන් ආරක්ෂාව පතමි.)

85 "අල්ලාහුම්මග්ෆිර් ලී, වහ්දිනී, වර්සුක්නී, වආෆිනී, අඌදු බිල්ලාහි මින් ළීකිල් මකාමි යව්මල් කියාමති"
(අහෝ දෙවිඳුනි! මට සමාව දෙනු මැනව! මට මඟ පෙන්වනු මැනව! මට ආහාර සපයනු මැනව! මට සුවය ලබා දෙනු මැනව!. නැවත නැඟිටුවනු ලබන දිනයේ ස්ථානයේ පටු බවින් මම අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමි.)

86 "අල්ලාහුම්ම මත්තිඃනී බිසම්ඊ, වබසරී, වජ්අල්හුමල් වාරිස මින්නී, වන්සුර්නී අලා මන් යළ්ලිමුනී, වඛුද් මින්හු බිසඃරී"
(අහෝ දෙවිඳුනි! මාගේ ශ්රවණය සහ මාගේ පෙනීම භුක්ති විඳීමට මට ඉඩ සළසා දෙනු මැනව! ඒවා මාගෙන් වූ උරුමක්කාරය බවට පත් කරනු මැනව! මට පීඩා කරන්නන්ට එරෙහිව මට උදව් කරනු මැනව! මා වෙනුවෙන් ඔවුනට සමප්රතිචාර දක්වනු මැනව!"

# تعرف على الإسلام

# بأكثر من 100 لغة

موسوعة القرآن الكريم
QuranEnc.com
ترجمات متقنة لمعاني القرآن الكريم بأكثر من (75) لغة

بيان الإسلام
byenah.com
مواد منتقاة للتعريف بالإسلام وتعليمه بأكثر من (120) لغة

موسوعة الأحاديث النبوية
HadeethEnc.com
ترجمات متقنة للأحاديث النبوية وشروحها بأكثر من (60) لغة

ضيوف الرحمن
hajjumrh.com
مواد منتقاة للحجـــاج والمعتمرين و الزوار بلغات العالم

جامع المحتوى الإسلامي باللغات
islamcontent.com
مواد إسلامية متنوعة وشاملة بأكثر من (125) لغة

موسوعات وخدمات إسلامية باللغات
s.islamenc.com
للمزيد من المواقع الإسلامية بلغـــات العـــالم

ضيوف الرحمن
hajjumrh.com

جمعية خدمة المحتوى الإسلامي باللغات